# සමිඳාණන්ගේ ස්වර්ගාරෝහණ මංගල්‍යය දේව ප්‍රකාශන 20-05-12

## පළමුවන කියැවීම

ක්‍රියා 1:1-11

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් ගත් පාඨයකි.

ඔවුන් බලා සිටියදීම ස්වාමින් වහන්සේ ස්වර්ගයට නැඟුණු සේක.

තියෝපිලස් තුමෙනි, ජේසුස් වහන්සේ කළාවූද ඉගැන්නුවාවූද සියලු දේ, මුලසිටම උන්වහන්සේ තෝරාගත් අපෝස්තුළුවරුන්ට ශුද්ධාත්මයාණන් කරණකොටගෙන අණ දී උන්වහන්සේ ස්වර්ගයට ඔසවා ගනු ලැබූ දවස දක්වා මාගේ ප්‍රථම කෘතියෙහි මම විස්තර කළෙමි. උන්වහන්සේගේ මරණයෙන් පසු සතළිස් දවසක් අතරතුර ඔවුනට දර්ශනය වෙමින් ද දෙවියන් වහන්සේගේ රාජ්‍යය ගැන දේශනාකරමින් ද බොහෝ නිසැක සාක්ෂිවලින් උන්වහන්සේ ජීවමානව ප්‍රකාශ වූ සේක. උන්වහන්සේ ඔවුන් සමග ආහාර වළඳමින් සිටියදී ඔවුන් අමතා, ''ඔබ ජෙරුසලමෙන් ඉවත්ව නොගොස්, මා වදාළ පරිදි පියාණන් වහන්සේගේ පොරොන්දුව බලාපොරොත්තුවෙන් සිටින්න. මන්ද. ජොහාන් වතුරෙන් බෞතීස්ම ස්නාපනය කළේය. එහෙත් මින් නොබෝ දවසකින් ඔබ ශුද්ධාත්මයාණන්ගෙන් බෞතීස්ම ස්නාපනය කරනු ලබන්නහු ය.''යි වදාළ සේක. අපෝස්තුළුවරුන් එක්රැස්වූ කළ, ''ස්වාමිනි, ඔබ යළිත් ඊශ්‍රායෙල් රාජ්‍ය පිහිටුවන කාලය මෙය ද?''යි ඔවුහු උන්වහන්සේ ගෙන් ඇසූහ. උන්වහන්සේ පිළිතුරු දෙමින්, ''පියාණන් වහන්සේ ස්වකීය ආධිපත්‍යයෙන් නියම කළ කාලයන් ද, අවස්ථාවන් ද දැනගැනීම ඔබට අයිති කාරියක් නොවේ. එහෙත් ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ කෙරෙහි පැමිණි කළ ඔබ බලය ලබන්නහුය. එවිට ඔබ ජෙරුසලමෙහිද, මුළු ජුදයෙහි හා සමාරියෙහි ද, පොළොවේ සීමාන්තයන් දක්වා ද, මාගේ සාක්ෂිකාරයෝ වන්නහුය.''යි වදාළ සේක. උන්වහන්සේ මෙසේ වදාරා ඔවුන් බලාසිටියදී ම ඔසවාගනු ලැබ, වලාකුළකින් වැසී ඔවුනට නොපෙනී ගිය සේක. උන්වහන්සේ යන කළ, ඔවුන් අහස දෙස බලාගෙන සිටියදී, සුදු වතින් සැරසුණු මනුෂ්‍යයෝ දෙදෙනෙක් ඔවුන් ළඟ සිට, ''ගලීලයේ වැසියෙනී, ඔබ අහස දෙස බලාගෙන සිටින්නේ කුමටද? ඔබ කෙරෙන් ඔසවා ගනු ලැබූ මෙම ජේසුස් වහන්සේ ස්වර්ගයට නගිනු දුටු සේම ආපසු වඩිනු ඇත.''යි කීහ. දේව වාක්‍යය එසේ ය.

දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 47:1-2, 5-8

පිළිතුර: දෙවිතුමන් හට පැසසුම් ගී ගයන්න.

ගීය: සව් සතුනි, අත් පොළසන් දෙන්න. ජය ඝෝෂා නංවා දෙවිඳුන්ට තුති දෙන්න. අති උතුම් සමිඳාණෝ බියකරු ය. මුලු මහ පොළොව කෙරේ අග රජය.

ජය ගොස නංවා, කාහල හඬ පතුරා එතුමාණෝ සිහසුන මත නැඟුණ සේක. දෙවිතුමන් හට ගී පසස් නගන්න. ගී පසස් නගන්න. අපේ නිරිඳු හට ගී පසස් නගන්න.

දෙවිඳාණෝ මුළු දෙරණට නිරිඳාණෝ ය. එතුමන් හට ගී පැසසුම් ගයන්න. දෙවිඳාණෝ ජාතීන් අතර රජිඳාණෝ ය. එතුමාණෝ සුවිශුද්ධ සිහසුන් අරා වැඩ සිටින සේක.

## දෙවන කියැවීම

එපේසි 1:17-23

ශුද්ධ වූ පාවුළු තුමන් විසින් එපේසිවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.
දෙවියන් වහන්සේ, ජේසුස් වහන්සේ ස්වර්ගයේ තමන් වහන්සේගේ දකුණු පස වැඩ සිටීමට සැලසූ සේක.

තේජසේ පියාණන් වූ, අපගේ ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දෙවියන් වහන්සේ උන් වහන්සේ අවබෝධ කර ගැනීම පිණිස ප්‍රඥාව සහ විදර්ශන ශක්තිය ඔබට දෙන මෙන් මම යාච්ඤා කරමි. තවද, උන් වහන්සේගේ කැඳවීමේ බලාපොරොත්තුව කිමෙක්ද කියාත්, සැදැහැවතුන්ට හිමි වන තේජාන්විත උරුමයේ ධන සම්භාරය කිමෙක් ද කියාත් ඇදහිලිවන්තයන් වන අප තුළ ක්‍රියා කරන, උන් වහන්සේගේ බලපරාක්‍රමයේ උදාර බව කිමෙක්ද කියාත්, ඔබ දැන ගන්නා පිණිස ඔබේ මනස පැහැදෙන සේ මම යාච්ඤා කරමි. දෙවියන් වහන්සේගේ ඒ වික්‍රමාන්විත බලපරාක්‍රමය නම් උන් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේ මරණයෙන් උත්ථාන කර, ස්වර්ග ලෝකයෙහි ස්වකීය දකුණු පස සිංහාසනාරූඪ කිරීමෙන්, ක්‍රිස්තුස් වහන්සේ තුළ උන් වහන්සේ ඉටු කළ ක්‍රියාකාරී බලය ම ය. එම ක්‍රිස්තුස් වහන්සේ සියලු අධිපතීන්ටත් එසේ ම මේ යුගයේ පමනක් නොව, මතු පැමිණෙන යුගයෙහි ද නම් කළ හැකි තාක් සියලු ප්‍රභූ නාමයන්ටත් ඉහළින් වැජඹෙන සේක. දෙවියන් වහන්සේ සියලු දේ ක්‍රිස්තුස් වහන්සේගේ පාදවලට යටත් කර, උන්වහන්සේ සභාවේ මහේශාක්‍ය නායකයාණන් කොට පත් කළ සේක. සභාව උන් වහන්සේගේ ශරීරය ය. ශරීරය එහි හිස වන සියල්ල බද්ධ කරන, ක්‍රිස්තුස් වහන්සේට සම්බන්ධ වූ විට, එකම සර්ව සම්පූර්ණත්වයක් ඇතිවේ.

දේව වාක්‍යය එසේ ය.
දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සාධුකාරය

මතෙව් 28:19-20

ආලේලූයා! ආලේලූයා!
''ඔබ ගොස් සකල ජාතීන් ගෝලයන් කරන්න.
මා ඔබට අණ කළ සියල්ල රක්ෂා කරන්නට ඔවුනට උගන්වන්න.
මම ද කල්පාන්තය දක්වා සදහට ම ඔබ හා සමඟ සිටිමි.''යි
ස්වාමින් වහන්සේ වදාළ සේක.
ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

මාක් 16:15-20

සුවිශේෂක මාක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.
ජේසුස් ස්වාමින් වහන්සේ ස්වර්ගාරෝහණය වී, දෙවියන් වහන්සේගේ දකුණු පස අසුන් ගත් සේක.

ජේසුස් වහන්සේ ඔවුන් අමතා, ''ලොව පුරා ගොස් සකළ සත්ත්වයා හට සුබ අස්න දේශනා කරන්න. අදහා බෞතීස්ම - ස්නාපනය ලබන තැනැත්තේ ගැළවීම ලබන්නේය. එහෙත්, අදහා නොගත් තැනැත්තේ වරදකරු යයි තීන්දුව ලබන්නේය. අදහන්නන් ඇසුරු කොටගත් හාස්කම් මේය. ඔව්හු මාගේ නාමයෙන් දුෂ්ටාත්ම දුරු කරති. අමුතු භාෂාවලින් කතා කරති. සර්පයන් අතින් අල්ලාගනිති. යම් මාරක විසක් බීවත් ඉන් කිසි අනතුරකට පත් නොවෙති. රෝගීන් පිට අත් තැබූ විට, ඔව්හු සුවය ලබති'' යි වදාළ සේක. මෙසේ ජේසුස් ස්වාමින් වහන්සේ ඔවුන්ට කතා කළ පසු, ස්වර්ගාරෝහණය වී, දෙවියන් වහන්සේගේ දකුණු පස අසුන් ගත් සේක. ඔව්හු නික්ම ගොස් සැම තැනම දේශනා කළහ. සමිඳාණන් වහන්සේ ද ඔවුන් සමඟ ක්‍රියා කරමින්, ඔවුන් අතර සිදු කළ හාස්කම් මඟින් ඒ දේශනය සහතික කර වදාළ සේක.
සුවිශේෂ වාක්‍යය එසේ ය.
ක්‍රිස්තුනී, ඔබ වහන්සේට ප්‍රසංශා වේවා.